# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1711/7 - 2011 ජුනි 20 වැනි සඳුදා - 2011.06.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

සී.එෆ්.අයි /64.

### (40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනත

(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ 5 වැනි වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදන ලද නියෝගය.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2011 ජුනි මස 20 වැනි දින,
කොළඹ දී ය.

නියෝගය

1. මේ නියෝගය 2011 අංක 4 දරන හදිසි අවස්ථා (පළාත් පාලන ආයතන පරිපාලන) නියෝගය යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. 2011.02.28 වැනි දින අංක 1695/4 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද, 2011 අංක 3 දරන හදිසි අවස්ථා (පළාත් පාලන ආයතන පරිපාලන) නියෝගවල කුමක් සඳහන් වුව ද, මේ නියෝගයේ උපලේඛනයේ II වැනි තීරයේ නිශ්චිතව සඳහන් කර ඇති දිනවල සිට බලපැවැත්වෙන පරිදි, (255 වැනි අධිකාරය වූ) නගර සභා ආඥාපනත සහ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ නැවත ඡන්දයක් පවත්වා එකී උපලේඛණයේ I වැනි තීරයේ නිශ්චිතව සඳහන් කර ඇති නගර සභාවලට සහ ප්‍රාදේශීය සභාවලට නියෝජිතයන් පත් කරනු ලබන තෙක් එම උපලේඛනයේ IV වැනි තීරුවේ නිශ්චිතව නම් සඳහන් කර ඇති නිලධරයන් වෙනුවට එකී උපලේඛනයේ III වැනි තීරයේ නිශ්චිතව නම් සඳහන් කර ඇති නිලධරයන්ට එකී නගර සභාවල සහ ප්‍රාදේශීය සභාවල කටයුතු පරිපාලනය පවරනු ලැබිය යුතු සහ ඒ නිලධරයන් විසින් එම පරිපාලන කටයුතු ක්‍රියාත්මක කරනු, ඉටුකරනු සහ කරනු ලබන ලෙස සළකනු ලැබිය යුතු ය.

උපලේඛනය

| *I වැනි තීරය* | *II වැනි තීරය* | *III වැනි තීරය* | *IV වැනි තීරය* |
|---|---|---|---|
| 1. ඇඹිලිපිටිය නගර සභාව | 2011.05.02 | මාබුල ඉද්දමල්ගොඩගේ දොන් කරුණාසේකර මහතා, පළාත් පාලන සහකාර කොමසාරිස්, සබරගමුව පළාත් සභාව. | එච්.ජී.කේ. පුෂ්පකුමාර මහතා, ප්‍රාදේශීය ලේකම්, ඇඹිලිපිටිය. |

1A - G 14717 — 830 (2011/06)

උපලේඛනය (සම්බන්ධිතයි)

| *I වන තීරය* | *II වන තීරය* | *III වන තීරය* | *IV වන තීරය* |
|---|---|---|---|
| 2. තංගල්ල සභාව | 2011.03.19 | පී.එච්.කේ. වික්ටර් මහතා, පළාත් පාලන සහකාර කොමසාරිස්, මාතර | බී.එස්.ජී. රුවන්සිරි මහතා, පළාත් පාලන සහකාර කොමසාරිස්, හම්බන්තොට. |
| 3. බද්දේගම ප්‍රාදේශීය සභාව | 2011.03.20 | සී.සී.මුහන්දිරම් මහතා, පළාත් පාලන සහකාර කොමසාරිස්, ගාල්ල. | පී.එස්. ගුණවර්ධන මහතා, ප්‍රාදේශීය ලේකම්, බද්දේගම. |
| 4. රත්නපුර ප්‍රාදේශීය සභාව | 2011.03.19 | සමරසිංහ ආරච්චිලාගේ දිසානන්ද මහතා, සබරගමුව පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යාංශයේ සහකාර ලේකම්. | සී.එම්. කෝට්ටවත්ත මිය, ප්‍රාදේශීය ලේකම්, රත්නපුර. |

07-327

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.